# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**1976 දෙසැම්බර් 24 වන දින**

**II වන කොටස**

## අතිරේකය

(77. 01. 05 දින නිකුත් කරන ලදී.)

## යුක්තිය පසිඳලීමේ (සංශෝධන)

**1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යවරයාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

එල්. ඩී.—ඕ. 38/76.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක      දරන යුක්තිය පසිඳලීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන පනතේ උපලේඛනය සංශෝධනය කිරීම.

2. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ උපලේඛනයෙහි “ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් ” යන ශීර්ෂ පාඨය යටතේ දැක්වෙන—

“ දිසා විනිශ්චයකාරවරයා—2 වන ශ්‍රේණිය—වර්ෂයකට රු. 18,240—600—රු. 20,640

මහේස්ත්‍රාත්වරයා—වර්ෂයකට රු. 13,440—480/600—රු. 20,640 ” යන වචන හා ඉලක්කම් වෙනුවට

“ දිසා විනිශ්චයකාරවරයා—2 වන ශ්‍රේණිය—වර්ෂයකට රු. 18,240—6×600—රු. 21,840

මහේස්ත්‍රාත්වරයා—වර්ෂයකට රු. 13,440—5×480—10×600—රු. 21,840 ”

යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

—ඒ 24353–6,965 (76/12)